Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල

### පුරප්පාඩු

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයීය රෝහල වෙත පහත සඳහන් තනතුරු සඳහා අදාළ සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. **විශේෂඥ වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය**

    1. විශේෂඥ වෛද්‍ය කායික රෝග
    2. විශේෂඥ වෛද්‍ය හදිසි ප්‍රතිකාර
    3. විශේෂඥ වෛද්‍ය නිර්වින්දන
    4. විශේෂඥ වෛද්‍ය දැඩි සත්කාර
    5. විශේෂඥ වෛද්‍ය හෘද රෝග
    6. විශේෂඥ වෛද්‍ය ළමා හෘද රෝග
    7. විශේෂඥ වෛද්‍ය රසායනවේදී
    8. විශේෂඥ වෛද්‍ය වාහිනික වෘක්කවේදී
    9. විශේෂඥ වෛද්‍ය රක්ත ව්‍යාදවේදී
    10. විශේෂඥ වෛද්‍ය අමාශ, ආන්ත්‍රික සහ අක්මා රෝග
    11. විශේෂඥ වෛද්‍ය ස්නායු රෝග
    12. විශේෂඥ වෛද්‍ය පවුල් වෛද්‍යවේදී
    13. විශේෂඥ වෛද්‍ය අන්තරාසර්ග
    14. විශේෂඥ වෛද්‍ය ප්‍රසව හා නාරිවේද
    15. විශේෂඥ වාහිනික සෛල වෛද්‍ය
    16. විශේෂඥ ශල්‍ය වෛද්‍ය උගුර, කන, නාසය
    17. විශේෂඥ ශල්‍ය වෛද්‍ය (වකුගඩු, අක්මා හා පිත්ත ප්‍රණාල බද්ධ කිරීම පිළිබඳ හැකියාව ඇති)
    18. විශේෂඥ ශල්‍ය වෛද්‍ය හෘද සැත්කම්
    19. විශේෂඥ ශල්‍ය වෛද්‍ය අමාශ, ආන්ත්‍රික සහ අක්මාරෝග
    20. විශේෂඥ ශල්‍ය වෛද්‍ය මුඛ, හනු, මුහුණු
    21. විශේෂඥ දන්ත ශල්‍ය වෛද්‍ය දන්ත විකලාංග

**සුදුසුකම් :**

I. 2018 අංක 28 දරන වෛද්‍ය (සංශෝධන) පනතට අනුව ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි / ලියාපදිංචි විය හැකි වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු විය යුතුය ;

හෝ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය සහිත වෛද්‍ය නිලධාරියෙකු හෝ දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු වීම ;

සහ

III. විශේෂඥ වෛද්‍ය (MD / MS) උපාධිය සමග කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මණ්ඩල සහතිකය (Board Certification) ලබා තිබීම. (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 2014.10.11 වැනි දින නිකුත් කරන ලද 1883/17 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* I වන ඇමුණුම) ;

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing"ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** MC 1-2 (රු. 91,645 -12 × 2,700 - රු. 124,045)

* විශේෂඥ වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය MC 1-2 පියවර 01හි තබනු ලැබේ.

2. **වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය**

**සුදුසුකම් :**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම ;

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල II ශ්‍රේණිය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර හයක (06) පළපුරුද්ද ලබා තිබීම ;

සහ

III. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 2014.10.11 වැනි දින නිකුත් කරන ලද 1883/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* II වන ඇමුණුම යටතේ පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම.

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing"ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** MO 1-1 (රු. 58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - රු. 99,015)

* වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ. - රු. 78,585.00

**3. දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි - I ශ්‍රේණිය**

**සුදුසුකම් :**

I. දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල II වන ශ්‍රේණියේ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර (09) ක පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් 11.10.2014 වැනි දින නිකුත් කරන ලද 1883/17 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පිළිගත් පශ්චාත් වෛද්‍ය උපාධියක් ලබා තිබීම.

සහ

IV. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing"ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** MO 1-1 (රු. 58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - 99,015)

* දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය MO 1-1 පියවර 14 හි තබනු ලැබේ. - රු. 78,585.00

**4. වෛද්‍ය නිලධාරි - II ශ්‍රේණිය**

**සුදුසුකම් :**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ පුද්ගලික වෛද්‍ය සේවා නියාමන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචිය ලබා ඇති, පුද්ගලික රෝහල්, සාත්තු නිවාස සහ මාතෘ නිවාස යන කාණ්ඩ යටතේ ක්‍රියාත්මක වන ආයතනවල අවම වශයෙන් වසර දෙකක (02) පළපුරුද්ද ලබා තිබීම.

සහ

III. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** MO 1-1 (රු. 58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - 99,015)

* වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය MO 1-1 පියවර 05 හි තබනු ලැබේ. - රු. 64,185.00

**5. දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි - II ශ්‍රේණිය**

**සුදුසුකම් :**

I. දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** MO 1-1 (රු. 58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - 99,015)

* දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය MO 1-1 පියවර 01 හි තබනු ලැබේ. - රු. 58,675.00

**6. වෛද්‍ය නිලධාරි - ප්‍රාථමික ශ්‍රේණිය**

**සුදුසුකම් :**

I. වෛද්‍යවරයෙකු ලෙස සේවය කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වලංගු පූර්ණ ලියාපදිංචිය ලබා තිබීම.

සහ

II. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නිකුත් කරන ලද "Certificate of Good Standing" ලබා තිබීම.

**වැටුප් පරිමාණය :** MO 1-1 (රු. 58,675 - 3 × 1,375 - 7 × 1,385 - 2 × 1,910 - 10 × 2,270 - 99,015)

* වෛද්‍ය නිලධාරී ප්‍රාථමික ශ්‍රේණිය MO 1-1 පියවර 02 හි තබනු ලැබේ. - රු. 60,050.00

**පොදු කොන්දේසි:**

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල තුළ හෝ විශ්වවිද්‍යාල පරිපාලනය මගින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම ස්ථානයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි මැනවින් ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික සහ මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
4. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.
5. මෙම තනතුර ස්ථිර වන අතර, වෛද්‍ය නිලධාරී ප්‍රාථමික ශ්‍රේණිය වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන

අතර විශේෂඥ වෛද්‍ය, වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය, වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය, දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරි II ශ්‍රේණිය, රාජ්‍ය සේවයෙහි රැකියාවෙහි නියුතුව සිටි නිලධාරීන් වසර එකක (01) පරිවාස කාලයකට යටත් වේ.

6. විශේෂඥ වෛද්‍යවරුන් වෛද්‍ය සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨ සිසුන්ගේ ඉගැන්වීම් සහ පුහුණුවීම් කටයුතුවලටද පශ්චාත් වෛද්‍ය අධ්‍යාපන කටයුතුවලටද දායක විය යුතු අතර, මෙම කාර්යය වෛද්‍ය හා සම සෞඛ්‍ය විද්‍යාපීඨවල පීඨාධිපතිවරුන්ගේ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මඟපෙන්වීම යටතේ සිදු කළ යුතුය.

7. සේවක අර්ථසාධක අරමුදල සඳහා ඔබගෙන් 10% දායකත්වයක්ද විශ්වවිද්‍යාලයෙන් 15% දායකත්වයක්ද දරන අතර සේවක භාරකාර අරමුදල සඳහා විශ්වවිද්‍යාලයෙන් 3% දායකත්වයක් දරනු ලැබේ. (පාර්ලිමේන්තුව විසින් නීතිය මගින් කරනු ලැබිය හැකි සංශෝධනවලට යටත්ව)

8. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමඟින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතිකවල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් 2021.07.18 දිනට පෙර විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර, යන ලිපිනයට යොමුකළ යුතු අතර, ලියුම් කවරයේ ඉහල වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළයුතුය.

9. අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

10. අසම්පූර්ණ, ප්‍රමාදවී ලැබුණු සහ අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11. අයදුම්පත්‍ර සහ අදාළ අනෙකුත් විස්තර භාගත කිරීම සඳහා පහත වෙබ් අඩවියට පිවිසෙන්න.

www.kdu.ac.lk

ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික),
ඩබ්ඩබ්වී ආර්ඩබ්වී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.